# මූල්‍ය වංචා: සැනසුම සොයා වැනසෙමු ද?



ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය වංචා පිළිබඳව නිකුත් කරන ලද ග්‍රන්ථයකි


මූල්‍ය බුද්ධි ඒකකය
நிதியியல் உளவறிதல் பிரிவு
FINANCIAL INTELLIGENCE UNIT

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මූල්‍ය වංචා: සැනසුම සොයා වැනසෙමු ද?

**මූල්‍ය බුද්ධි ඒකකය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

සිතුවම්: අනුර ශ්‍රීනාත්

ISBN 978-624-5917-51-8

2023 දෙසැම්බර්

පොලිස් ස්ථානයේ දී....


පාර්සල් වංචාව
පිටු 1-2
ලොතරැයි වංචාව
පිටුව 3
රැකියා වංචාව
පිටුව 4
ප්‍රේම වංචාව
පිටු 5-6
භාණ්ඩ/ සේවා වංචාව
පිටු 7-8
මාර්ගගත සාප්පු සවාරි (online shopping) සහ ජංගම ගෙවීම් යෙදවුම් (payment app) වංචාව
පිටු 9-10
අන් වෙස් ගැනීම/ අනනපතා සොරකම
පිටු 11-12
අප්‍රකාශිත විද්‍යුත් මුදල් (Cryptocurrency) වංචාව
පිටුව 13

# පාර්සල් වංචාව

අමල් යනු පෞද්ගලික සමාගමක රැකියාව සිදු කරන, වයස අවුරුදු 30ක පුද්ගලයෙකි. ඔහු කුලී නිවසක වාසය කරන, සාමාන්‍ය ආදායම් උපයන්නෙකි. දිනක් අමල්ගේ දුරකථනයට කෙටි පණිවුඩයක් ලැබේ.







තම පාර්සලය ලැබෙතැයි අපේක්ෂා කරමින් අමල් රු. 30,000ක් තැන්පත් කරයි. ඔහු සැබවින් ම පාර්සලයක් දිනා ඇති බවට ඔහුට විශ්වාස බැවින්, ඔහු එය තහවුරු කර ගැනීමට ඇමතුමක් ලබා ගැනීම හෝ කෙටි පණිවුඩයක් යොමු කිරීම සිදු නොකරයි.






## පාර්සල් වංචාවෙහි ප්‍රධාන ලක්ෂණ

1. ඔබ අගනා රත්‍රන්, ස්වර්ණාභරණ හෝ මුදල් පාර්සලයක් දිනා ඇති බව ඔබ වෙත දන්වමින් කෙටි පණිවුඩයක්, දුරකථන ඇමතුමක් හෝ ඊමේල් පණිවුඩයක් ලැබීම. මෙම පණිවුඩය සාමාන්‍යයෙන් ව්‍යාකරණමය දෝෂ සහිත වන අතර, පාර්සලය තුළ වටිනා බඩුබාහිර ආදිය බහා ඇති ආකාරයේ ඡායාරූප ඒ සමග එවනු ලැබේ.

2. හැකි තාක් ඉක්මනින් පාර්සලය හිමි කර ගැනීමට මුදල් තැන්පත් කරන මෙන් ඉල්ලා සිටීම.



# ලොතරැයි වංචාව

25 හැවිරිදි රංග, රජයේ ආයතනයක සේවය කරන පුද්ගලයෙකි. ඔහු ඔහුගේ විවාහ උත්සවය සඳහා සූදානම් වෙමින් සිටින අතර, ඔහු BMW රථයක් දිනා ඇති බවට පවසමින් දිනක් ඇමෙරිකා එක්සත් ජනපදයෙහි BMW ආයතනයෙන් ඔහුට විද්‍යුත් තැපැල් පණිවුඩයක් ලැබේ.

**BMW ජයග්‍රාහක**
2023, ජනවාරි 01, පෙ.ව. 10.13
BMWannuallottery@gmail.com විසින්
ranga@gmail.com වෙත
හිතවත් රංග,
ඔබ ඇමෙරිකා එක්සත් ජනපදයෙන් රු. මිලියන 1.5ක් වටිනා අති නවීන BMW රථයක් දිනා ඇති බව අපි සතුටින් දන්වා සිටිමු. වැඩි විස්තර සඳහා, david@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ අපගේ ශ්‍රී ලංකා නියෝජිතයා වන ඩේවිඩ් මහතා කරුණාකර සම්බන්ධ කර ගන්න.



රංග තවමත් වාහන ණයක් සඳහා සුදුසුකම් ලබා නොමැති හෙයින්, ඔහු සතුටින් ඉපිලී ගියේය. ඔහුට මෙය සිහිනයක් සැබෑ වුවාක් මෙනි. ඔහු මහත් වුවමනාවෙන් ඩේවිඩ් වෙත ප්‍රතිචාර දක්වන අතර, පහත පිළිතුරු ඔහු වෙත ලැබේ.

**BMW ජයග්‍රාහක**
2023, ජනවාරි 01, පෙ.ව. 11.30
david@gmail.com විසින්
ranga@gmail.com වෙත

හිතවත් රංග,

ඔබගේ කඩිනම් ප්‍රතිචාරයට බොහොම ස්තූතියි. අප එය නැව්ගත කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටින්නෙමු. xxx xxx යන බැංකු ගිණුම් අංකයට නැව් ගාස්තු ලෙස රු. 120,000ක් තැන්පත් කරන්න.

**2023, ජනවාරි 06, ප.ව. 02.44**

ඔබේ BMW රථය ශ්‍රී ලංකාවට පැමිණ ඇත. එය නිෂ්කාශනය සඳහා ශ්‍රී ලංකා රේගුවෙහි රැඳී සිටියි. කරුණාකර නිෂ්කාශන ගාස්තු ලෙස රු. 100,000ක් තැන්පත් කරන්න.

**2023, ජනවාරි 08, පෙ.ව. 09.15**

ඔබේ BMW රථය නිෂ්කාශනය කර ඇති අතර, එය ඔබ නිවසටම ගෙනවා දීම සඳහා ප්‍රවාහන ගාස්තු ලෙස රු. 50,000ක් ඉහත ගිණුම් අංකයට තැන්පත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමු.

රංග BMW රථය ලබා ගැනීමට මේ වන විට රු. 300,000කට ආසන්න මුදලක් තැන්පත් කර ඇති බැවින් ඔහුට සැකසහිත බවක් හැඟෙන්නට විය. ඔහු මේ පිළිබඳව වැඩි විස්තර ලබා ගැනීම සඳහා ඩේවිඩ් වෙත විද්‍යුත් පණිවුඩයක් යොමු කරන නමුත්, කිසිදු පිළිතුරක් ඔහුට නොලැබේ.

## ලොතරැයි වංචාවෙහි ප්‍රධාන ලක්ෂණ

1. ඔබ BMW රථයක් හෝ ලොතරැයි දිනුමක් දිනා ඇති බව දැනුම් දෙමින් කෙටි පණිවුඩයක්, දුරකථන ඇමතුමක් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් ලැබීම.

2. නැව් ගාස්තු, නිෂ්කාශන ගාස්තු සහ ප්‍රවාහන ගාස්තු වශයෙන් අවස්ථා කිහිපයක දී මුදල් තැන්පත් කරන මෙන් ඉල්ලා සිටීම.



# රැකියා වංචාව

ඉසුරු සහ සචිනි 21 වියැති සහෝදර සහෝදරියන්වේ. රැකියාවක් සඳහා විදේශ ගත වීම ඉසුරුගේ සිහිනය යි. කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සචිනිට ඇයගේ රැකියාව මෑතක දී අහිමි වූ අතර, ඇය නිවසේ සිට වැඩ කිරීමට අවස්ථාවක් සොයමින් සිටියි. ඔවුන් දෙදෙනාම පුවත්පත් සහ වෙබ් අඩවිවල රැකියා අවස්ථා සඳහා අයදුම් කරන අතර, දිනක් සචිනිට රැකියාවක් ලබා දෙන බව පවසමින් ආයතනයකින් දුරකථන ඇමතුමක් ලැබේ.







ඉසුරු සහ සචිනි රැකියා අවස්ථා දෙකක් සුරක්ෂිත කර ගැනීමට රු. 150,000 තැන්පත් කරති. නමුත්, පසුව ඔවුන් සේවා යෝජකයා සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළ විට, කිසිදු ප්‍රතිචාරයක් නොලැබේ.





## රැකියා වංචාවක ප්‍රධාන ලක්ෂණ

1. ආකර්ෂණීය වැටුපක් සමග රැකියා අවස්ථා ඉතා කඩිනමින් සහ පහසුවෙන් පිරිනැමීම.
2. ලැප්ටොප් පරිගණක, සහ අන්තර්ජාල පහසුකම් හෝ විදේශගත රැකියා සඳහා ලේඛන සූදානම් කිරීම සඳහා මුදල් තැන්පත් කරන මෙන් ඉල්ලීම.



# ප්‍රේම වංචාව

ඉන්දි අධිසුඛෝපභෝගී දිවියක් ගත කරන, 36 හැවිරිදි ධනවත් කාන්තාවකි. ඇය සමාජ මාධ්‍ය ක්‍රියාකාරිනියක වන අතර, සමාජ මාධ්‍යයෙහි ඇගේ ජීවිතය පිළිබඳ විස්තර නිතිපතා ප්‍රකාශයට පත් කරන්නී ය. ඉංග්‍රීසි ජාතිකයෙකු වන එඩ්වඩ් සමාජ මාධ්‍යය ඔස්සේ ඉන්දි සමග මිතුරු වෙයි. ඔවුන්ගේ ආදරය දළුළා වැඩෙන අතර, එඩ්වඩ් ඇයව විවාහ කර ගැනීමට ඔහු සතු කැමැත්ත ප්‍රකාශ කරයි. ඔහු ඔහුගේ ශ්‍රී ලාංකික මිතුරකු වන සුරාජ් සේවයට යොදා ගනිමින් ලංකාවේ නිවසක් සෑදීමට සැලසුම් කරයි.



ඉන්දි මුදල් තැන්පත් කළ පසු සුරාජ් සහ එඩ්වඩ් දෙදෙනාම ප්‍රතිචාර නොදක්වයි. ඉන්දි ඇයගේ මුදල් සහ ප්‍රේමය අහිමි වූ බැවින් මානසික ආතතියට පත් වෙයි.



## ප්‍රේම වංචාවක ප්‍රධාන ලක්ෂණ


1. ආගන්තුක පුද්ගලයෙකු ආදරය, ප්‍රේමය සහිත සුඛෝපභෝගී ජීවිතයක් ඔබට ලබාදීමට පොරොන්දු වෙයි.

2. පෞද්ගලිකව ඔබට මුණ ගැසිය නොහැකි පරිදි විදේශිකයෙකු හෝ විදෙස්ගතව ජීවත් වන ලාංකිකයෙකු මේ සඳහා සම්බන්ධ වීම.

3. නිවසක් මිල දී ගැනීමට, විවාහ උත්සවයක් සංවිධානය කර ගැනීමට හෝ සංක්‍රමණය වීම සඳහා මුදල් ඉල්ලීම.

# භාණ්ඩ/ සේවා වංචාව

අභී යනු හතළිස් හැවිරිදි සංගීතඥයෙකි. නුවර දී ම ඔහුගේ සංගීත සංදර්ශනයක් තිබෙන බැවින්, ඒ සඳහා ඔහු බෙර කට්ටලයක් සොයමින් සිටින අතර ඒ පිළිබඳවූ ප්‍රචාරණ දැන්වීමක් ඔහුට වෙබ් අඩවියකින් හමුවේ.



අහිංසක විකුණුම්කරු එවූ ස්ථානය වෙත යයි. එය අසත්‍ය ලිපිනයක් බවත්, ඔහු රැවටී ඇති බවත් ඔහුට අවබෝධ වෙයි.





## භාණ්ඩ/ සේවා වංචාවක ප්‍රධාන ලක්ෂණ

1. ඇදහිය නොහැකි, අනගි වාසි රැසක් සහිතව හෝ අඩු මිලට භාණ්ඩයක් හෝ සේවාවක් විකිණීමට තිබීම.
2. භාණ්ඩය හෝ සේවාව වෙන් කරවා ගැනීමට අත්තිකාරම් මුදලක් ඉල්ලීම.

# මාර්ගගත සාප්පු සවාරි (online shopping) සහ ජංගම ගෙවීම් යෙදවුම් (payment app) වංචාව

සත්‍යා යනු නිරතුරුව ම මාර්ගගත සාප්පු සවාරිවල නිරත වී සිටින 18 වියැති කාන්තාවකි. ඇය ඉතා කැමැත්තෙන් එය සිදු කරන අතර, දිනකට ඇණවුම් ගණනාවක් සිදු කරයි. ආරම්භයේ දී සත්‍යා, මාර්ගගත සාප්පු සවාරි සිදු කිරීම සඳහා ජනප්‍රිය වෙබ් අඩවි භාවිත කරයි. කාලයත් සමඟ, ඇය ඉතාමත් අවම මිල ගණන්වලට විශිෂ්ට සන්නාම අයිතම පිරිනමනු ලබන නව මාර්ගගත ගනුදෙනුකරුවන් සහ වෙබ් අඩවි සමඟ ඇණවුම් කිරීම අරඹයි.



සත්‍යා ඇයගේ මව වන 55 වියැති සුධර්මාටද මෙම මාර්ගගත සාප්පු සවාරි හඳුන්වා දෙයි. ඒත් සමඟ ම, සුධර්මා අවම මිලට සාරි මිලට ගැනීමේ දීමනාවක් දකින අතර, ඇය ඒ සඳහා ඇණවුමක් තබයි. පසු දින විකුණුම්කරු ඇයට ඇමතුමක් ලබා දී ඇණවුම් සඳහා ගෙවීම් සිදු කිරීමට පහසු ක්‍රමයක් ඇති බවත්, ඇයගේ ගිණුම් අංකය, පෞද්ගලික විස්තර සහ ඇය වෙත ලැබුණු පෞද්ගලික හඳුනා ගැනීමේ අංකය (OTP) ඉල්ලා සිටියි. සුධර්මා දෙවරක් නොසිතා එය ලබා දෙයි.



සති කිහිපයකට පසුව, සුධර්මා වෙත තම බැංකුවෙන් දුරකථන ඇමතුමක් ලැබෙන්නේ ගනුදෙනුකරුවන් කිහිපදෙනෙකු ඇයගේ ගිණුම පිළිබඳ ව බැංකුව වෙත පැමිණිලි කර ඇති බව පවසමින්. ඇය ඉතා ඉක්මනින් බැංකුව වෙත යන අතර, එහි දී ඇයගේ බැංකු ගිණුම ගෙවීම් යෙදවුමකට සම්බන්ධ කර ඇති බවත්, වෙනත් පුද්ගලයන් එම ගිණුම වංචා කිහිපයක් ඇතුළුව විවිධ අරමුණු සඳහා මෙහෙයවා ඇති බවත් ඇයට වැටහෙයි.

ඒත් සමග ම, සත්‍යා සුධර්මා වෙත දුරකථනයෙන් අමතා, ඇය විසිතුරු අයිතම මිල දී ගැනීමට සිදු කළ ඇණවුම් තවමත් නොලැබුණු බවට පැමිණිලි කරයි.





## මාර්ගගත සාප්පු සවාරි සහ ගෙවීම් ජංගම යෙදවුම් වංචාවක ප්‍රධාන ලක්ෂණ

1. ඉතාමත් අවම මිල ගණන්වලට විශිෂ්ට සන්නාමවලින් යුත් අයිතම පිරිනැමීම.
2. විදේශ රටවල් පදනම් කරගත් ව්‍යාපාර සහ එහි විශ්වසනීයත්වය පිළිබඳව සීමිත තොරතුරු ඇති නව මාර්ගගත වෙළෙඳසැල් භාවිතා කිරීම.
3. ලුහුබැඳීමට සහ අවලංගු කිරීමට අසීරු ක්‍රිප්ටෝ මුදල් වැනි ක්‍රමවේදවලින් ගෙවීම් සිදු කරන මෙන් ඉල්ලීම.
4. එක් වරක් පමණක් යොදන මුර පදය / පෞද්ගලික හඳුනා ගැනීමේ අංකය (OTP/PIN) වැනි රහසිගත මූල්‍ය තොරතුරු ඉල්ලා සිටීම.

# අන් වෙස් ගැනීම/ අනන්‍යතා සොරකම

ගෘහණියක වන ෆාතිමා නම් සිය බිරිඳ සමග දිවි ගෙවන මොහොමඩ් 62 හැවිරිදි විශ්‍රාමිකයෙකි. ඔවුන්ගේ එකම ආදායම් මාර්ගය මොහොමඩ්ගේ විශ්‍රාම වැටුප වන අතර, වැඩි වන උද්ධමනය අයහපත් ආකාරයෙන් ඔවුන්ට බලපා ඇත. දිනක් මොහොමඩ් පිටකොටුව ප්‍රදේශයේ භාණ්ඩ මිල දී ගන්නා අවස්ථාවක දී ලාල් ඔහු වෙත ළඟා වෙයි.






## අන් වෙස් ගැනීම/ අනන්‍යතා සොරකමෙහි ප්‍රධාන ලක්ෂණ

1. කිසියම් පුද්ගලයෙකු ප්‍රතිලාභ හුවමාරු කර ගැනීමට ජාතික හැඳුනුම්පත, බැංකු ගිණුම් විස්තර, හරපත්, ණයපත් වැනි ඔබේ පෞද්ගලික තොරතුරු ඉල්ලා සිටීම.


2. ඉහත තොරතුරු සොරකම් කොට හෝ කැමැත්තෙන් ලබා ගැනීම.




# අප්‍රකාශිත විද්‍යුත් මුදල් (Cryptocurrency) වංචාව

සූර්යා සහ චන්ද්‍රා 28 හැවිරිදි හොඳම යහළුවන්. දෙදෙනා ම තාක්ෂණයට ඉතා ඇලුම් කරන අතර, ක්‍රිප්ටෝ මුදල් ආයෝජන සඳහා විවෘත අවස්ථාවක් අන්තර්ජාලයෙහි දකිති.




## ක්‍රිප්ටෝ මුදල් වංචාවක ප්‍රධාන ලක්ෂණ

1. මෙය ආරම්භක ආයෝජනය අහිමි කරන මූල්‍ය වංචාවක් (scam) විය හැක.
2. නැතහොත් එය දිගු කලකට පසු දරා ගත නොහැකි අලාභයක් සිදු කරන පිරමීඩ යෝජනා ක්‍රමයක් ද විය හැකිය.


# කළ යුතු සහ නොකළ යුතු දෑ

## කළ යුතු දෑ

- සැමවිටම ගෙවීම් සිදු කිරීමට පෙර ගෙවීම් විස්තර සහතික කර ගන්න.
- දැන හඳුනාගත් පාර්ශ්වයන් සමග පමණක් ආරක්ෂිතව පෞද්ගලික විස්තර බෙදා ගන්න.
- සැක සහිත හෝ හඳුනා නොගත් විද්‍යුත් තැපැල් පණිවුඩ, පණිවුඩ, අධිබැඳි (hyperlinks), උත්පතන කවුළු (pop-up windows) යනාදිය සමග ගනුදෙනු කිරීමේ දී ප්‍රවේශම් වන්න.
- ඕනෑම සැකසහිත මූල්‍ය ආයතනයක් සම්බන්ධව ඔබේ පවුල, වැඩිහිටියන්, සමීප මිතුරන් සහ බලධාරීන්ගේ සහාය ලබා ගන්න. එමෙන්ම ඒ පිළිබඳ අන් අය ද දැනුවත් කරන්න.
- ඔබ ජංගම යෙදුම් (Apps), එක් වරක් පමණක් භාවිත කළ හැකි මුර පද (OTP), ක්ෂණික කියවීම් කේත (QR codes), ණයපත්/ බැරපත් පිළිබඳ මූල්‍ය දැනුමින් සන්නද්ධ වන්න.
- මූල්‍ය ලොව තුළ තිබෙන නවීනතම ධනාත්මක සහ සෘණාත්මක ප්‍රවණතා සමග යාවත්කාලීන වන්න.

## නොකළ යුතු දෑ

- බැංකු ගිණුම් විස්තර, ණයපත්/ බැරපත් විස්තර, එක් වරක් පමණක් භාවිත කළ හැකි මුරපද (OTPs) නාඳුනන පාර්ශ්ව වෙත ලබා නොදෙන්න.
- ජාතික හැඳුනුම්පත, ණයපත්/ බැරපත්, බැංකු පොත් යනාදී පෞද්ගලික ලේඛන ආගන්තුකයන්ට ලබා නොදෙන්න.
- පූර්ව සත්‍යාපනයකින් තොරව නොදන්නා පුද්ගලයන් වෙත ගෙවීම් සිදු කිරීම හෝ නොදැක ඇති නිෂ්පාදිත මිල දී ගැනීම සිදු නොකරන්න.
- සමාජ මාධ්‍යයන් ඔස්සේ පමණට වඩා පෞද්ගලික තොරතුරු බෙදා නොගන්න.
- නොදන්නා/ සැකසහිත සබැඳි (links) සහ විද්‍යුත් තැපැල් පණිවුඩ ක්ලික්/ විවෘත නොකරන්න.
- වගකීමකින් තොරව, නොසැලකිලිමත් ලෙස ක්‍රියා නොකරන්න.


නැවතත් පොලිස් ස්ථානයේ දී....
**නොමිලයේ යැයි කියා කිසිවක් නොමැත.** මූල්‍ය වංචාවක් තුළ පොරොන්දු වන ප්‍රතිලාභ ආරම්භයේ දී පොළඹවනසුලු විය හැකි වුවත්, අවසානයේ දී පාඩු ලැබීමට තුඩු දිය හැකිය. එබැවින්, කරුණාකර ඔබව මූල්‍ය වංචාවලින් ආරක්ෂා කර ගැනීමට ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගන්න.
**සැකයක් ඇතිවූ විට, ඇයි දැයි විමසන්න.** ප්‍රශ්න ඇසීම තුළින් ඔබව මූල්‍ය වංචාවක ගොදුරක් බවට පත් වීම වලක්වා ගත හැකිය. ඔබ ආගන්තුකයෙකු වෙත මුදල් ලබා දීමට පෙර එය කුමක් සඳහා දැයි විමසන්න. ඔබේ ණයපත්/ බැරපත් විස්තර කිසිඳු පුද්ගලයෙකුට ලබා නොදෙන්න.
**නැහැ/බැහැ කීමට ඉගෙන ගන්න.** වංචාකරුවන් ඔබේ විශ්වාසය සහ කරුණාව ලබා ගැනීමට ඉතා දක්ෂය. ඔවුන් මිනිසුන්ගේ චිත්තවේග සමග සෙල්ලම් කිරීමට හොඳින් දනී. ඔබ චිත්තවේගාත්මක හැසිරවීමකට මුහුණ දුන් විට නැහැ/ බැහැ යැයි තරයේ ප්‍රකාශ කර සිටින්න.
ඔබ මූල්‍ය වංචාවක ගොදුරක් බවට පත්වුවහොත්, හැකිතාක් ඉක්මනින් ළඟම ඇති පොලිස් ස්ථානයට පැමිණිල්ලක් යොමු කරන්න. බැංකු ගිණුමක් සම්බන්ධ වී ඇත්නම්, මූල්‍ය වංචාව අදාළ බැංකුව වෙත වාර්තා කරන්න. නමුත් මතක තබා ගන්න, **අවදානමට පෙර ආරක්ෂාව වඩා යහපත්** බැවින් මූල්‍ය වංචාවලට හසු නොවී සිටීම නුවණට හුරු ය.

# ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ පණිවුඩයකි

මූල්‍ය බුද්ධි ඒකකය වන අපි ඔබේ මූල්‍යයන්හි සුරක්ෂිතභාවය තහවුරු කිරීමට කැපවී සිටින්නෙමු. මෑතක දී, පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් මත දැඩි බලපෑමක් එල්ල කරන විවිධ මූල්‍ය වංචාවල ඉහළ යෑමක් අපට නිරීක්ෂණය විය. මෙම වංචා පිළිබඳ ඔබව දැනුවත් කර, එවැනි වංචාවලට ඔබ ගොදුරු වීමෙන් වළක්වා ඔබව ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය දැනුමෙන් සන්නද්ධ කිරීම අපගේ යුතුකම වේ.

ඔබ වෙහෙසී උපයා ගත් මුදල කැප කිරීමට පෙර, ඔබේ ආයෝජන තීරණ මොහොතකට හෝ යළි සලකා බලන්න. මෙම යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීමට පෙර ඒවායෙහි නීත්‍යානුකූලභාවය මැනවින් විමර්ශනය කර බැලීම වැදගත් වේ.

**ඔබව ආරක්ෂා කර ගැනීමට පොදු උපදෙස් කිහිපයක්:**

1. **දැනුවත්ව සිටින්න:** පොදු මූල්‍ය වංචා සහ ඒවායෙහි ලක්ෂණ පිළිබඳ ව දැනුවත් ව සිටින්න. දැනුම ඔබේ හොඳම ආරක්ෂාවයි.

2. **සත්‍යාපනය කරන්න: සත්‍යාපනය කරන්න: සත්‍යාපනය කරන්න:** සෑම විටම යම් ක්‍රියාවක් සිදු කිරීමට හෝ ගෙවීමක් සිදු කිරීමට පෙර දීමනා, නිෂ්පාදිත හෝ සේවාවන්හි නීත්‍යානුකූලභාවය තහවුරු කර ගන්න.

3. **පෞද්ගලික තොරතුරු ආරක්ෂා කරගන්න:** කිසි විටෙකත් නාඳුනන පුද්ගලයන් හෝ ආයතන සමඟ පෞද්ගලික හෝ මූල්‍ය තොරතුරු හුවමාරු කර නොගන්න. නීත්‍යානුකූල ආයතන මෙවැනි තොරතුරු ඉල්ලා නොසිටිනු ඇත.

4. **ආරක්ෂාකාරී ගෙවීම් ක්‍රම භාවිත කරන්න:** මාර්ගගත ගනුදෙනු සිදු කිරීමේ දී ආරක්ෂාකාරී සහ පිළිගත් ගෙවීම් ක්‍රම පමණක් භාවිත කරන්න. නාඳුනන ගනුදෙනු සඳහා වයර් හුවමාරු (wire transfer) හෝ පෙරගෙවුම් කාඩ්පත් භාවිතයෙන් වළකින්න.

5. **ඔබේ සහජ බුද්ධිය විශ්වාස කරන්න:** යමක් ඇදහිය නොහැකි ආකාරයෙන් හොඳ යැයි පෙනී යන්නේ නම් හෝ සැක මතු වන්නේ නම්, ඔබේ සහජ බුද්ධිය විශ්වාස කර වැඩිදුරටත් විමර්ශනය කරන්න.

6. **සැක කටයුතු ක්‍රියාකාරකම් වාර්තා කරන්න:** සිදු විය හැකි වංචාවක් පිළිබඳ ඔබට දැන ගැනීමට ලැබුණේ නම් හෝ ඔබ දැනටමත් වංචාවක ගොදුරක් නම්, ඒ බව ළඟම ඇති පොලීසිය, අදාළ බැංකුව හෝ මූල්‍ය බුද්ධි ඒකකය වැනි බලධාරීන් වෙත වාර්තා කරන්න.

7. **අන් අය දැනුවත් කරන්න:** මෙම තොරතුරු ඔබේ මිතුරන්ගේ සහ පවුලේ සුරක්ෂිත බව තහවුරු කර ගැනීම සඳහා ඔවුන් සමඟ බෙදා ගන්න.

ඔබේ මූල්‍ය සුරක්ෂිතභාවය අපට අතිශය වැදගත් වේ. අවධානයෙන් සහ දැනුවත්භාවයෙන් සිටීම මගින් ඔබට ඔබත් ඔබේ ආදරණීයයන් ද මෙම මූල්‍ය වංචාවලට ගොදුරු වීමෙන් වළක්වා ගත හැකියි. කරුණාකර ඔබට යම් ගැටලුවක් ඇත්නම් හෝ සහායක් අවශ්‍ය වන්නේ නම්, මූල්‍ය බුද්ධි ඒකකය හෝ ළඟම ඇති පොලිස් ස්ථානය අමතීමට පසුබට නොවන්න.

එක්ව, සියලුදෙනා උදෙසා වඩාත් ආරක්ෂාකාරී මූල්‍ය පරිසරයක් ගොඩනගා ගනිමු.

**ඇමතුම් විස්තර**


දුරකථන අංකය: +94112 477509 (ස්ථාවර), +94765 200290 (WhatsApp)

විද්‍යුත් තැපෑල : dfiu@cbsl.lk

ලිපිනය : මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුව.
අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.

වෙබ් අඩවිය : www.fiusrilanka.gov.lk